අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818 | info@moe.gov.lk | www.moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2025 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2025.12. 02 |

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරුන්

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම -2025**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2025 සඳහා 2025.02.28 දිනැති අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 12/2025 ප්‍රකාරව අයදුම්පත් කැඳවන ලද අතර එම වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල යෝජනා අනුමත කර එම නියෝග 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ (http:/www/moe.gov.lk ) පළකර ඇත.

02. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 12/2025 හි සඳහන් පටිපාටියට අනුකූලව පහත පරිදි නිලධාරීන් ස්ථාන මාරු සඳහා යටත් කර ඇත.

- 2024.12.31දිනට වසර 06 කට වැඩි සේවා කාලයක් හිමි, මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්
- 2024.12.31දිනට වසර 06 කට වැඩි සේවා කාලයක් හිමි, මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් නොකරන ලද නිලධාරීන්
- 2024.12.31දිනට වසර 03 ත් 06ත් අතර සේවා කාලයක් හිමි, මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්

03. උක්ත නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී DMS/0039/NSC- III සහ 2024.02.19 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී නිලධාරීන් සංඛ්‍යාව පාදක කර ගනිමින් පුරප්පාඩු ගණනය කිරීම සිදු කර ඇති අතර (ඇමුණුම 01) 2025.12.31 දින දක්වා විශ්‍රාම යාම මත ඇතිවන පුරප්පාඩුද සැලකිල්ලට ගනිමින් ස්ථාන මාරු ගැලපීම් සිදුකර ඇත.

04. ඒ අනුව අදාළ පාසලෙහි පුරප්පාඩු මත ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ

- වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ අවධානය යොමු වී නැත්නම්
- ස්ථාන මාරු පටිපාටියට පටහැනිව ස්ථාන මාරු ලබා දී ඇත්නම් හෝ
- ස්ථාන මාරු අයදුම් කළ දින හා ස්ථාන මාරු යෝජනා ප්‍රසිද්ධ කරනු ලබන දිනය අතර කාලය තුලදී විශේෂ වූද ඉතා බරපතල වූද පෞද්ගලික දුෂ්කරතා පැන නැගී ඇති බවට කරුණු ඉදිරිපත් කරනු ලබන නිලධාරීන්ට පමණක් අභියාචනා ඉදිරිපත් කළ හැකිය

05. අභියාචනා ඉල්ලුම්පත්‍රයෙහි ආදර්ශයක් ( ඇමුණුම 02) මෙ සමඟ අමුණා ඇති අතර එම ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අභියාචනා සහ එයට අදාළ අනෙකුත් සනාථ කිරීමේ තොරතුරු අදාළ නිලධාරීන්ගේ නිර්දේශ සහිතව පරිලෝකනය (Scan) කර PDF පිටපතක් ලෙස atslps2025@gmail.com යන විද්‍යුත් ලිපිනය ඔස්සේ 2025.12.15 මධ්‍යහ්න 12.00 ට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් දන්වමි. ස්ථාන මාරු ලේඛනයේ අදාළ නිලධරයන්ට ලබා දී ඇති අනු අංකය අභියාචනා ඉල්ලුම් පත්‍රයේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර එම අංකය විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව (Subject) යටතේද සඳහන් කළ යුතුය. නියමිත වේලාවට පසුව ලැබෙන අභියාචනා සමාලෝචනය සඳහා සලකා බලනු නොලැබෙන බව කාරුණිකව දන්වමි.

06. නිලධාරීන් විසින් අභියාචනා ඉදිරිපත් නොකරන්නේ නම් විධිමත් පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස් වී ස්ථාන මාරුව ක්‍රියාත්මක වන 2026.01.01 දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගෙන විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මෙම අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව වෙත දැනුම් දිය යුතුය.

07. ඔබ පාසලේ සේවය නියුතු ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන්, **<u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u>** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

නාලක කලුවැව
ලේකම්